VERITÉ
විදසුන්

Originally Published in: [, , ]

# ශ්‍රී ලංකාවේ ආයෝජනයට සහ වෙළදාමට ඇති නිදහස පහළට

2015 වසරේ හෙරිටේජ් පදනම විසින් ගණනය කරනු ලබන ගෝලීය ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ ලකුණු 58.6 ක් ලබා ගනිමින් ශ්‍රී ලංකාව රටවල් 178 ක් අතරින් 101 වෙනි ස්ථානය හිමිකරගෙන ඇත. මෙම දර්ශකයට අනුව 2001-2010 කාලය තුල ශ්‍රී ලංකාවේ ආර්ථික නිදහස දැඩි පසු බෑමකට ලක් වී ඇත. අනෙකුත් රටවල් සමග සැසඳීමේ දී මෙම කාලය තුල 66 වෙනි ස්ථානයේ සිට 119 වෙනි ස්ථානය දක්වා ශ්‍රී ලංකාව පහළට වැටී ඇත.

පශ්චාත් යුධ සමයේ දී මෙම සෘණ ප්‍රවනතාවය වෙනස් කරමින් යම් ප්‍රගතියක් පෙන්නුම් කිරීමට සමත් වූවද එම ප්‍රගතිය කෙටි කාලීන ප්‍රවනතාවයක් බව, පෙනී යයි. 2013-2014 වසර දෙක තුල නැවතත් ආර්ථික නිදහස පසුබෑමක් පෙන්නුම් කරයි. මෙහිදී වෙළදාමට සහ ආයෝජනයට ඇති නිදහස සීමා වීම විශේෂයෙන් කැපී පෙනෙයි.

## ආර්ථික නිදහස වැදගත් වන්නේ ඇයි ?

හෙරිටේජ් පදනම 1995 සිට මෙම දර්ශකය ගණනය කරනු ලබයි. මෙහිදී පුළුල් ක්ෂේත්‍ර 04 ක් ඇගයීමට ලක් කරයි. එනම්, නීතියේ පාලනය , රජයේ සීමිත බව , රෙගුලාසි වල කාර්යක්ෂමතාවය සහ වෙළදපොල විවෘත භාවය යන ක්ෂේත්‍ර 04 යි. ආර්ථික නිදහස රටකට වැදගත් වන්නේ මෙම නිදහස සහ අනෙකුත් ආර්ථික සාධක අතර ධනාත්මක සම්බන්ධයක් ඇති බැවිණි. උදාහරණයක් ලෙස පර්යේෂණ මගින් පෙන්වා දෙන්නේ රටක ආර්ථික නිදහස සහ මානව සංවර්ධන දර්ශක අතර ධනාත්මක සංවර්ධනයක් ඇති බවයි.

එසේම ආර්ථික නිදහස වැඩි රටවල බහුමාන දරිද්‍රතාවය අඩු බවද පර්යේෂණ මගින් පෙන්වා දේ. බහුමාන දරිද්‍රතාව, තනි පුද්ගලයෙකුට අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අපහසුතාව සහ ජීවන තත්ත්වය ඇගයීමට ලක් කරන නිර්ණායකයකි. රූප සටහන් 1 මගින් පෙන්වා දෙන පරිදි මෙම දර්ශකය ගණනය කිරීමේ දී මෙම ක්ෂේත්‍ර 04 නිර්ණායක 10 ක් ආශ්‍රයෙන් ඇගයීමට ලක් කරනු ලබයි.

## පශ්චාත් යුධ සමයේ ප්‍රගතිය නැවත පසු බෑමකට

හෙරිටේජ් පදනම දර්ශක අගයට අනුව රටවල් වල ආර්ථික නිදහස කොටස් 05 කට වර්ගීකරණය කරයි. ලකුණු 50 ට අඩු රටවල් ආර්ථික නිදහස මර්ධනය කරනු ලබන රටවල් ලෙසද ලකුණු 50 - 59.9 ලබා ගන්නා රටවල් ආර්ථික නිදහස බොහෝ දුරට නැති රටවල් ලෙසද , ලකුණු 60 - 69.9 ක් ලබා ගන්නා රටවල් මධ්‍යස්ථ නිදහසක් ඇති රටවල් ලෙසද , 70 - 79.9 ක් ලබා ගන්නා රටවල් බොහෝ දුරට ආර්ථික නිදහස ඇති රටවල් ලෙසද , ලකුණු 80 ට වැඩි රටවල් ආර්ථික නිදහස ඇති රටවල් ලෙසද වර්ගීකරණය වේ.

පශ්චාත් යුධ සමයේ අත්කරගත් ප්‍රගතිය නිසා ශ්‍රී ලංකාව 2012 දී මධ්‍යස්ථ ආර්ථික නිදහස් ඇති රටක් බවට පත් වේ. රජයේ වියදම පාලනය කිරීමට සහ අයවැය පරතරය අඩු කිරීමට රජය පියවර ගැනීම සහ උද්ධමනය පහළ යාම මෙම ප්‍රගතියට විශේෂයෙන්ම දායක විය. එහෙත් 2013/2014 වසර වල ඇති වූ පසුබෑම නිසා ශ්‍රී ලංකාව නැවතත් ''බොහෝ දුරට ආර්ථික නිදහස නැති'' රටක් බවට පත්ව ඇත. මෙම පසුබෑමට ආයෝජනය සහ වෙළදාම සම්බන්ධයෙන් ඇති නිදහස සීමා වීම විශේෂයෙන්ම හේතු වී ඇත.

## <u>වෙළදාමට සහ ආයෝජනයට ඇති නිදහස සීමා වීම</u>


2005-2010 කාළය තුළ වෙළදාම සහ ආයෝජනය සම්බන්ධයෙන් ඇති ආර්ථික නිදහස දිගින් දිගටම පසුබෑමට ලක් වී ඇත. 2011-2012 කාළය තුල යම් ප්‍රගතියක් පෙන්නුම් කලද 2013-2014 යන වසර වල නිදහස නැවත පරිහානියට ලක් වී ඇත. (රූප සටහන් 2) ශ්‍රී ලංකාවේ සමස්ථ ආර්ථික නිදහසේ පසුබෑමට මෙය බෙහෙවින් හේතු වී ඇත.

ශ්‍රී ලංකාව සමග වෙළදාම් කිරීමේ දී ආනයන සහ අපනයනකරුවන් මුහුණ දෙන තීරු බදු සහ තීරුබදු නොවන බාධක වෙළද නිදහස සීමා කරයි. ආයෝජන නිදහස විවිධ රෙගුලාසි, රාජ්‍ය අංශයේ අකාර්‍යක්ෂම බව, විදේශ විනිමය සීමා සහ දූෂණය වැනි හේතුන් නිසා පිරිහීමට ලක් වේ.


2005 දී ලෝකයේ සාමාන්‍ය නිදහස සමග සැසදීමේ දී ශ්‍රී ලංකාවේ වෙළදාමට ඇති නිදහස ඊට ඉදිරියෙන් ද ආයෝජනයට ඇති නිදහස ඊට සමාන මට්ටමක ද පැවතිණි. 2014 වන විට ලංකාව ලෝක සාමාන්‍ය අගය සමග සැසදීමේ දී ඊට පසු පසින් සිටී. එපමණක් නොව 2005 යුධ සමයේ පැවති නිදහසට වඩා 2014 වසරේදී වෙළදාමට සහ ආයෝජනයට ඇති නිදහස පහළ මට්ටමක පවතී.

අපනයන සහ විදේශ ආයෝජන ප්‍රවර්ධනය තුළින් ආර්ථික සංවර්ධනය ලගා කර ගැනීමට බලාපොරොත්තු වන රටක් ලෙස පසුගිය වසර දෙක තුල දක්නට ලැබෙන මෙම පසුබෑම කණගාටුදායක තත්ත්වයකි. එබැවින් මෙම පසුබෑමට හේතුවූ කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ආර්ථිකයේ ඉදිරි ගමන සාර්ථක කර ගැනීමට වැදගත් වනු ඇත.

**රූප සටහන් 01: ගෝලීය ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ සංයුතිය**




**රූප සටහන් 02: ආයෝජන නිදහස, වෙළඳ නිදහස සහ ශ්‍රී ලංකාවේ දර්ශකය**



80
70
60
50
40
30
20
10
2005
2006
2007
2008
2009
2010
2011
2012
2013
2014
2015
Invest freed
ආයෝජන නිදහස
Trade
වෙළඳ නිදහස
Count
ශ්‍රී ලංකාවේ දර්ශකය